# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1851/20 - 2014 පෙබරවාරි මස 26 වැනි බදාදා - 2014.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය*: VSW/DS/LAND/PS-ILAVA/D.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පවරා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

| | | |
|---|---|---|
| ප්‍රාථමික සැලසුම | :- | PP 1326 |
| පිහිටීම | :- | මාදගල් |
| ප්‍රා. ලේ. කොට්ඨාසය | :- | වලිකාමම් නිරිත |
| දිස්ත්‍රික්කය | :- | යාපනය |
| පළාත | :- | උතුර |

01. **කැබලි අංක 02**

ඉඩමේ නම: පොතිපුලම්; විස්තරය: අවුරුදු 30-40 පොල් ගස් 142යි, අවුරුදු 10-40 අඹ ගස් 08යි, අවුරුදු 10-80 තල් ගස් 201යි, අවුරුදු 10-40 කොහොඹ ගස් 05යි, අවුරුදු 10-40 සවුක්කු ගස් 15යි, ස්ථිර ගොඩනැගිලි 04යි, සිමෙන්තියෙන් තැනූ ළිං 01යි, සිමෙන්තියෙන් තැනූ වතුර ටැංකි 01යි; හිමිකරුගේ නම: සී. ආර්. තිස්සනායගම්, අංක 14, රජින පාර, කොළඹ 03; ප්‍රමාණය: අක්කර 04, රූඩ 03, පර්චස් 24.8.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 අප්‍රේල් මස 04 වැනි දින පෙ.ව. 10.00 ට වලිකාමම් නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 මාර්තු මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එස්. මුරලිදරන්,
ප්‍රාදේශීය ලේකම්,
සංදිලිප්පායි.

2014 පෙබරවාරි මස 25 වැනි දින,
සන්දිලිප්පායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 – 305


1A - G 019124 - 90 - (2014/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.